**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය.**

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**මිල සැදැහුම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට භාණ්ඩ,සේවා හා වැඩ සපයා ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026**

පහත දැක්වෙන අමුද්‍රව්‍ය වර්ග, භාණ්ඩ හා සේවා එකක් හෝ කිහිපයක් හෝ සියල්ල සැපයිය හැකි පුද්ගලයන් හෝ ආයතන ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සැපයුම්කරුවන් වශයෙන් 2026 වර්ෂය සඳහා ලියාපදිංචි කරගැනීම සඳහා **අයදුම්පත් 2025. 06. 02 දින සිට 2025. 06. 24 දක්වා** භාර ගනු ලැබේ. ගම් මට්ටමේ සිටින ඖෂධ වගා කරන ගොවීන්, ඖෂධ එකතු කර සපයන අය, ඔසු ගොවි සංවිධාන, රාජ්‍ය ආයතන හා ඔසු ගොවි සමාගම්ද ලියාපදිංචි කරනු ලැබේ.

**01. මිලදී ගන්නා අමුද්‍රව්‍ය වර්ග/භාණ්ඩ/සේවා/වැඩ**

I. **වියළි අමුද්‍රව්‍ය (දේශිය)**

i. **උදාහරණ:-** අරළු ගෙඩි, අත්තන සහ මුල, අශෝක පොතු, අස්වැන්න සහ මුල, එළබටු, බුළු, පොල්පලා, බෙලි මුල්, ඇහැළ පොතු යනාදි අමුද්‍රව්‍ය ඇතුළු අමුද්‍රව්‍ය වර්ග 150කට වැඩි ප්‍රමාණයකින් අමු ද්‍රව්‍ය එක් වර්ගයක් හෝ කිහිපයක් ඔබට සැපයීමේ හැකියාව ඇත. සංස්ථාව අපේක්ෂා කරන ප්‍රමිතියට හොඳින් වේලා සැපයිය යුතු වේ.(තෙතමනය තිබිය යුත්තේ 5%-10% අතර පමණකි.)

II. **වියළි අමු ද්‍රව්‍ය (ආනයනික )**

i. පත්පාඩගම්, අසමෝදගම්, කරොල්අරිසි, ගෙන්දගම්, අමුක්කරා අල, ගුගුල, කළුදුරු ,කට්පල පොතු, ඖෂධීය මුද්දරප්පලම්, පීතකරෝසන යනාදි අමුද්‍රව්‍ය ඇතුළු අමුද්‍රව්‍ය වර්ග 70 කට වැඩි ප්‍රමාණයක් අතුරින් එක් වර්ගයක් හෝ කිහිපයක් සංස්ථාව අපේක්ෂිත ප්‍රමිතියට ඔබට සැපයිය හැකිය .

III. **අමුවෙන් ලබාගන්නා අමු ද්‍රව්‍ය**

i. ආඩතෝඩා කොළ පොතු, ආඩතෝඩා මුල්, ආඩතෝඩා සහ මුල, අළු කෙසෙල් අල, ඇඹුල් ඇඹිලිය සහ මුල, ඇඹුල් දෙඩම්, අංකෙන්ද කොළ පොතු, අත්තන කොළ, අත්තන සහ මුල, එළබටු ගෙඩි, යක්වනස්ස, එළඔළිඳ, එරබදු කොළ පොතු, බෝ පොතු, බුලත්, දෙමට ගෙඩි, දෙළුම් ගෙඩි, දිවුල් පොතු, දිය හබරල, ගම්මිරිස් මුල්, ගස්පෙනල ගෙඩි, ගිරිතිල්ල කොළ, වැල් ගොටු කොළ, හම්පිල්ල, හාතාවාරිය අල ඇතුළු දේශියව වැවෙන විශාල අමුද්‍රව්‍ය ප්‍රමාණයක් මේ කාණ්ඩයට අයත් වේ. මේ කාණ්ඩය යටතේ අමුද්‍රව්‍ය මිල දී ගැනීමේ දී අමුද්‍රව්‍ය තනි තනි වශයෙන් මිල දී ගැනීමක් සිදු නොවේ. ඔබ විසින් එක් බෙහෙත් වට්ටෝරුවක් (වැඩපතක් ) සඳහා අවශ්‍ය සියළු අමුද්‍රව්‍ය හා ප්‍රමාණ සැපයිය යුතු වේ.

ii. **උදාහරණ:-** නීලයාදී තෛලය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අං කෙනද කොළ හා පොතු, මදටිය කොළ හා පොතු, වැල් කැප්පෙටියා කොළ හා පොතු, දිය හබරල, නිල් අවරිය කොළ අවශ්‍ය ප්‍රමාණයන් එක් සැපයුම්කරුවෙකු විසින්ම සැපයිය යුතුය.

iii. මෙවැනි වැඩපත් 30 ක් පමණ ඇති අතර අමු ඉඟුරු, අමු කහ, දෙහි, හාතාවාරිය අල, අළු පුහුල්, පොල්, කිතුල් හකුරු යනාදිය තනි වශයෙන් සැපයීමට ද හැකිය.

iv. අමු කොළ, පොතු, මුල් වර්ග සැපයීමේදී ඒවා ජීවී පැළෑටි වලින් ලබා ගෙන දින 03 ක් ඇතුලත සංස්ථාවට සැපයිය යුතුය.

IV. **කුළු බඩු වර්ග**

කරාබු නැටි, ගොරකා, උළුහාල්, ගම්මිරිස්, කොත්තමල්ලි, සුදුළුණු, සාදික්කා, එනසහල්, වසාවාසි, මහදුරු, සුදුදුරු යනාදිය සහ අනෙකුත් කුළුබඩු වර්ග අවශ්‍යවන විට දි මිලදී ගැනීම. කුළුබඩු වර්ග ඖෂධ නිෂ්පාදනයට අදළ ගුණාංග වලින් යුක්ත විය යුතුය.

V. **තෙල් හා දියර වර්ග**

අබ තෙල්, එළඟි තෙල්, එඩරු තෙල්, මී තෙල්, පොල් තෙල්, සුදු පොල් තෙල්, තල තෙල්, කොහොඹ තෙල්, ටර්පන්ටයින්, මී පැණි සහ අනෙකුත් තෙල් හා දියරවර්ග

අදාල තෙල් හා දියර වර්ග ශ්‍රී ලංකා ප්‍රමිති අධිකාරියේ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වෛද්‍ය මණ්ඩලයේ හා රසායනාගාරයේ පරීක්ෂණ තුළින් සපයන තෙල් හා දියර වර්ගවල ප්‍රමිතිය පිළිබඳ අවසාන තිරණ ගනු ඇත.

VI. **වීදුරු බෝතල් (පාච්චි නොකළ)**

ආහාර හා ඖෂධ වර්ග ඇසුරුම් කිරීමට සුදුසු ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූල පාච්චි නොකළ පහත සඳහන් බෝතල් වර්ග.

1. අවුන්ස 1 සිට මි.ලී 750 දක්වා සුදු පැහැති බෝතල්
2. ග්‍රෑම් 200 /250 /400 /450 දක්වා සුදු පැහැති ජෑම් බෝතල්
3. මි.ලි 100/200 /500 දුඹුරු පැහැති බෝතල්

VII. **බෝතල් මූඩි (ඇළුමිනියම්)**

මුද්‍රණය කල/ නොකල පහත ප්‍රමාණයන්ගෙන් ඇළුමිනියම් මූඩි මි.මී. 31.5/ මි.මී. 28 /මි.මී.25/ මි.මී. 22

VIII. **මුද්‍රණය කළ /නොකළ කාර්ඩ්බෝඩ්, කාඩ්බෝඩ් පෙට්ටි,** (කෝරුගේටඩ් /Corrugated Boxes)

IX. **පොලිතින්, මුද්‍රිත ඇසුරුම්, සෙලෝපේන්, පොලිතින් බෑග් මුද්‍රණ, ශ්‍රින්ක්කැප්, ඇලුෆොයිල් , ඇලුමිනියම්ෆොයිල් , ටී බෑග්** (Tea Bag ) Bopp Cut Sheet
සැ.යු. (මධ්‍යම පරිසර අධිකාරියේ 2017 .09. 05 දින ගැසට් නිවේදනයට අදාලව භාවිතයට සුදුසු පොලිතින් විය යුතුය )

X. **Maisa Envelope මුද්‍රණය** ( Tea bag, Tea Envelop Printing, Customer Tea Bag Printing)

XI. **පරිගණක /පරිගණක උපාංග/ ජාලකරණ උපාංග/ තීන්ත /ටෝනර් / රිබන් / කාට්රිජ් / මුද්‍රණ යන්ත්‍ර**

XII. ලිපි ද්‍රව්‍ය (පෑන්/පැන්සල්/ස්ටෙප්ලර්/ලියුම් කවර/ඡායා පිටපත් කඩදාසි/වෙනත් ඕනෑම වර්ගයක කාර්යාලීය ලිපි ද්‍රව්‍ය)

XIII. **විදුලි කාර්මික ද්‍රව්‍ය හා උපාංග සැපයීම**. (වයර්, ස්විච්, සොකට්, බල්බ් යනාදිය )

XIV. **වායුසමීකරණ යන්ත්‍ර / අළුත්වැඩියාව, නඩත්තු කිරීම සහ සේවා කිරීම.**

XV. **ගොඩනැගිලි ද්‍රව්‍ය** (ගල්, වැලි ,සිමෙන්ති, වානේ කම්බි, GI Pipe, GI Box, Metal L-Bar, Iron Mesh, Aluminum/ Aluminum Partition / Curtains තීන්ත යනාදිය.)

XVI. **ගොඩනැගිලි ඉදිකිරීම්, අළුත්වැඩියා හා නඩත්තු (සුළු හා මධ්‍ය පරිමාණ) ඇලුමිණියම් බහිෂ්කාර** (ඉදිකිරීම්, නවීකරණයන් සහ අභ්‍යන්තර බෙදු වෙන්කිරීම් සඳහා. වෙනත් ඕනෑම වර්ගයක ගොඩනැගිළි ඉදිකිරීමේ ද්‍රවය)

XVII. **කාර්යාල උපකරණ** (දැව, වානේ, ප්ලාස්ටික්, MDF, මැලමයින් යනාදියෙන් නිෂ්පාදනය කරන ලද කාර්යාල මේස, පුටු, රාක්ක, කබඩ් වෙනත් ඕනෑම වර්ගයක ගෘහ භාණ්ඩ)

XVIII. **වාහන අමතර කොටස්, වාහන අළුත්වැඩියාව, නඩත්තු කිරීම සහ සේවා කිරීම**

XIX. **නිෂ්පාදනාගාර යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ**

XX. **නිෂ්පාදනාගාර උපකරණ අළුත්වැඩියා සහ අමතර කොටස්**

XXI. **පිරිද්දුම් / වෑද්දුම් හා ලියවනපට්ටල් වැඩ (යකඩ/සුදු යකඩ** MIG Welding, TIG Welding, GAS Welding, SPOT Welding, Electric Welding යනාදිය)

XXII. **රසායන ද්‍රව්‍ය** ෆේෂ් වොෂ් /බොඩි වොෂ්/ ෂැම්පු/හර්බල් වයින්/හර්බල් ඩ්‍රින්ක් සඳහා අවශ්‍ය රසායනද්‍රව්‍ය

XXIII. **රසායනාගාර උපකරණ** (Erlenmeyer Flask/Buret/Beaker/Florence Flask/Funnel/Test tubes / Clamps / වෙනත් ඕනෑම වර්ගයක රසායනාගාර ආශ්‍රිත ද්‍රව්‍ය)

XXIV. **ප්ලාස්ටික් බෝතල්/ ප්ලාස්ටික් බෝතල් මූඩි** සංස්ථාව නිෂ්පාදනය කරන ඖෂධ වර්ග ඇසුරුම් කිරීම සඳහා සුදුසු ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතියෙන් යුතු විය යුතුය. (Food grade)

XXV. **මුද්‍රණ කටයුතු** (ලේබල් /ස්ටිකර් /ඇසුරුම් පෙට්ටි/අත් පත්‍රිකා/පෝස්ටර්/බැනර් /නාම පුවරු /ලිපිකවර / ලිපි ගොනු කවර යනාදිය.) (මේ සඳහා අයදුම්කල හැක්කේ මුද්‍රණාල හිමිකරුවන්ට පමණි.)

XXVI. **ආරක්ෂිත උපකරණ** (Construction/ Welding/ Electrical/ Workshop/ Lab/ (අත්වැසුම් / මුඛ වැසුම්/සියලුම වර්ගවල සපත්තු )

XXVII. **සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා උපකරණ (** කොසු / ඉදල් / බුරුසු / පාපිසි / සබන් / පිරිසිදුකාරක ද්‍රව්‍ය ....................)

XXVIII. **කෘෂි උපකරණ** (විල්බැරෝ /උදලු /මුල්ලු /රබර් හෝස් / Sekator / Alkathene pipe / පොහොරවර්ග / ජලනල හා උපාංග සහ වෙනත් ඕනෑම වර්ගයක කෘෂිකාර්මික ද්‍රව්‍ය)

XXIX. **තේකොළ / කිරිපිටි......,**

XXX. **නිළ ඇඳුම් සැපයීම** (ඇඳුම් මැසීම / නිළ ඇඳුම් රෙදි වර්ග සැපයීම)

XXXI. **හානිකර කෘමීන් පාලනය කිරීමේ සේවාවන්** (මදුරුවන් / වේයන් / මකුනන් / මැස්සන් / මීයන් / කැරපොත්තන් ආදී හානිකර කෘමීන් පාලනය)

XXXII. **සනීපාරක්ෂක කටයුතු කිරීම පිළිබඳව සේවා සැපයීම.** (කාර්යාලීය පිරිසිදු කිරීම්/ වැසිකිළි/ කැසිකිළි/කාර්යාලීය පරිශ්‍ර පිරිසිදු කිරීම් වෙනත් ඕනෑම සනීපාරක්ෂක කටයුතු)

XXXIII. **ආරක්ෂක සේවා සැපයීම...,**

XXXIV. **ලේබල් නිර්මාණය කිරීම සඳහා ආයතන...,**

XXXV. **කෙටි ආහාර සැපයීම උදෑසන සහ රාත්‍රී ආහාර සැපයීම. (මහරගම, නුගේගොඩ, බත්තරමුල්ල, පන්නිපිටිය, කොට්ටාව,)**

02. **අයදුම්පත් එවිය යුතු ආකාරය** - ආදර්ශ අයදුම්පත www.sladc.lk, www.ayurveda.gov.lk සහ www.mim.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ සහ https://www.facebook.com/Sri Lanka Ayurvedic Drugs Corporation බාගත කරගත හැකි අතර හෝ ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් හෝ නාවින්න ප්‍රධාන කාර්යාලයට පැමිණ අයදුම්පත් ලබාගත හැකි අතර 2025. 06. 24 දින ප.ව 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **''සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, නො 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ගෙනවිත් බාර දිය හැක.

*විශේෂ:*

2026 වර්ෂය සදහා ඔබ/ඔබ ආයතනය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ලියා පදිංචි වන්නේනම් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ මුදල් ගෙවූ රිසිට්පත හෝ මුදල් ඇණවුම සමඟ නියමිත දිනට එනම් 2025. 06. 24. දින ප.ව 02.00ට පෙර සංස්ථාව වෙත ගෙනවිත් භාරදෙන්න. අයදුම්පත් භාරගන්නා දිනය පසුව් ලැබෙන අයදුම්පත් භාරගැනීම සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කරණු ලැබේ. තැපැල් සේවාවේ පවතින ප්‍රමාදයන් හේතුවෙන් ඔබෙගේ / ඔබ ආයතනයේ අයදුම්පත් අප වෙත ප්‍රමාදවී ලැබෙන බැවින් එම අයදුම්පත් භාරගනු නොලැබේ. (2025. 06. 24 දින 02.00 පසුවී ලැබෙන අයදුම්පත්) තැපෑල මඟින් සිදුවන ප්‍රමාදයන් වලක්වාගැනීම සඳහා ඔබගේ අයදුම්පත් භාරගන්නා දිනට පෙර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ගෙනවිත් භාරදෙන ලෙස කාරුණිකව දන්වමි.

ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **'' සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026 වර්ෂය සඳහා''** යනුවෙන් සහ **අයදුම් කරන භාණ්ඩ, සේවා හා වැඩ කාණ්ඩය** සඳහන් කළ යුතුය.

03. **ලියාපදිංචි කිරීමේ ගාස්තු** - ලියාපදිංචි ගාස්තුව එක් සැපයුම් බාණ්ඩයක් සඳහා **රු.1000 කි . උදා:-** වියළි ඖෂධ සඳහා ලියාපදිංචියට රු.1000 කි. තෙල් වර්ග සඳහා ලියාපදිංචියට රු.1000 කි. (එවැනි වර්ග 3 ක් සදහා ලියාපදිංචි ගාස්තුව රු.3000 කි.)

ඒ සඳහා **''සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව''** නමින් මුදල් ඇණවුමක් එවිය යුතු වේ. මුදල් ඇණවුමේ **ගෙවන කාර්යාලය මහරගම තැපැල් කාර්යාලය** යනුවෙන් සඳහන් කල යුතුය. ඊට අමතරව සංස්ථාවේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවිය හැකිය. රාජ්‍ය ආයතන ලියාපදිංචි ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අයදුම්පත සමඟ මුදල් ඇණවුම/මුදල් අයකැමි වෙත මුදල් ගෙවූ කුවිතාන්සිය අමුණා එවිය යුතුය. **චෙක්පත් මඟින් ගෙවීම් සිදුකල නොහැක.** (ලියාපදිංචි වීම සඳහා ගෙවන ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.)

**04. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම** - නියමිත දිනට ලැබෙන නිසි පරිදි සම්පූර්ණ කර ලියාපදිංචි ගාස්තු ද ගෙවා ඇති අයදුම්පත් පරික්ෂා කර බලා සුදුසු අයවලුන් **2026 වර්ෂය** සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් සහ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ලියාපදිංචි කරගනු ලබන සැපයුම්කරුවන්ට ඒ බව ලිඛිතව දැනුම් දෙනු ඇත.

**මෙම දැන්වීම පහත වෙබ් අඩවි තුල පළ කර ඇත.**

- වෙබ් අඩවිය - www.sladc.lk - ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
- සංස්ථා Facebook - https://www.facebook.com/Sri Lanka Ayurvedic Drugs Corporation
- වෙබ් අඩවිය - www.mim.gov.lk - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - දේශීය වෛද්‍ය අංශය
- වෙබ් අඩවිය - www.ayurveda.gov.lk - ආයුර්වේද දෙපාර්තමේන්තු

**වැඩි විස්තර සඳහා අමතන්න.**

- පොදු දුරකථන - 011-2850229
- සැපයුම් කළමනාකරු - 011-2840162
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථා අලෙවි මධ්‍යස්ථාන වලින්
- ඊමේල් - ayurvedicdrugs@sltnet.lk / chairmanayurveda@gmail.com/

  itsladc@gmail.com
- Fax - 011-2844357

සභාපති,
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

# 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
இலங்கை ஆயுர்வேத மருந்துப்பொருள் கூட்டுத்தாபனம்
SRI LANKA AYURVEDIC DRUGS CORPORATION
No. 94 Old Kottawa Road,Nawinna, Maharagama. Tel: +94 11 2850229 Fax: +94 11 2844357
Website: www.ayurvediccorp.gov.lk E-mail: ayurvedicdrugs@sltnet.lk

අයදුම්පත් අංකය
Application Number

SLADC<<SUP<<REG
<<<2026<<<COM<<

## අයදුම් පත්‍රය

දිනය: D D M M Y Y Y Y

### කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. ලියාපදිංචි අංක :
02. දිස්ත්‍රික්කය :
03. නගරය :
04. මුදල් ඇණවුම්/ලදුපත් අංකය :
05. තැපැල් කාර්යාලය :

### 01. පුද්ගලික තොරතුරු

(කරුණාකර පැහැදිලි අත් අකුරින් කොටුව තුළ පමණක් සටහන් කරන්න.)

1.1 සම්පූර්ණ නම: (ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි)

1.2 ස්ථිර ලිපිනය:

1.3 ජාතික හැඳුනුම්පත් අංකය:

1.4 ස්ථාවර දුරකථන අංකය:

ජංගම දුරකථන අංකය:

1.5 විද්‍යුත් තැපැල් (Email) ලිපිනය:

1.6 ෆැක්ස් අංකය:

(කරුණාකර සත්‍ය හා නිවැරදි තොරතුරු පමණක් මෙහි සටහන් කරන්න.)

### 02. ව්‍යාපාරික තොරතුරු

(කරුණාකර පැහැදිලි අත් අකුරින් කොටුව තුළ පමණක් සටහන් කරන්න.)

2.1 ව්‍යාපාර /ආයතනයේ නම:

2.2 ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය:

2.3 ව්‍යාපාරය ලියාපදිංචි අංකය:

2.4 ස්ථාවර දුරකථන අංකය:

ජංගම දුරකථන අංකය:

2.5 විද්‍යුත් තැපැල් (Email) ලිපිනය:

2.6 ෆැක්ස් අංකය:

2.7 දිස්ත්‍රික්කය:

2.8 වැට්බදු (VAT) අංකය:

(කරුණාකර සත්‍ය හා නිවැරදි තොරතුරු පමණක් මෙහි සටහන් කරන්න.)

### 03. වැදගත්

(කරුණාකර පැහැදිලි අත් අකුරින් කොටුව තුළ පමණක් සටහන් කරන්න.)

3.1 සැපයීමට අපේක්ෂා කරනු ලබන ද්‍රව්‍ය / සේවා ගණන:

3.2 වටිනාකම රු:

3.3 මුදල් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය: මුදල් ඇණවුම් ඔව්: ☐ ලදුපත් මඟින් ඔව්: ☐ ලදුපත් අංකය:

3.4 තැපැල් කාර්යාලය:

මුදල් ඇණවුම් අංකය:

(කරුණාකර සත්‍ය හා නිවැරදි තොරතුරු පමණක් මෙහි සටහන් කරන්න.)

(කරුණාකර අනෙක් පිටුව බලන්න...)

## 04. සැපයීමට අපේක්ෂාකරනු ලබන ද්‍රව්‍ය / සේවා

කොටුව තුළ "✓" සලකුණ යොදන්න

| | | |
|---|---|---|
| 4.1. | වියළි අමුද්‍රව්‍ය (දේශීය) | ☐ |
| 4.2. | වියළි අමුද්‍රව්‍ය (ආනයනික) | ☐ |
| 4.3. | අමුවෙන් ලබාගන්නා අමුද්‍රව්‍ය | ☐ |
| 4.4. | කුළුබඩු වර්ග | ☐ |
| 4.5. | තෙල් හා දියර වර්ග | ☐ |
| 4.6. | වීදුරු බෝතල් (පාවිච්චි නොකළ) | ☐ |
| 4.7. | බෝතල් මූඩි (ඇළුමිනියම්) | ☐ |
| 4.8. | මුද්‍රණය කළ / නොකළ කාඩ්බෝඩ් පෙට්ටි (Corrugated) | ☐ |
| 4.9. | පොලිතීන් / මුද්‍රිත ඇසුරුම් / සෙලෝපේන් / Polypropylene යනාදිය | ☐ |
| 4.10. | Maisa Envelop මුද්‍රණය (Tea bag, Tea Envelop Printing, Customer Tea Bag Printing) | ☐ |
| 4.11. | පරිගණක / පරිගණක උපාංග / ජාලකරණ උපාංග / තීන්ත / මුද්‍රණ යන්ත්‍ර | ☐ |
| 4.12. | ලිපි ද්‍රව්‍ය | ☐ |
| 4.13. | විදුලි කාර්මික ද්‍රව්‍ය /.උපාංග (වයර් / ස්විච් /සොකට්/බල්බ් යනාදිය) | ☐ |
| 4.14. | වායුසමීකරණ යන්ත්‍ර/ අළුත්වැඩියාව / නඩත්තුකිරීම සහ සේවාකිරීම | ☐ |
| 4.15. | ගොඩනැගිලි ද්‍රව්‍ය (ගල්, වැලි, සිමෙන්ති, වානේ කම්බි, තීන්ත යනාදිය) | ☐ |
| 4.16. | ගොඩනැගිලි ඉදිකිරීමේ හා අළුත්වැඩියා (සුළු හා මධ්‍ය පරිමාණ) | ☐ |
| 4.17. | කාර්යාල උපකරණ (දැව / වානේ / ප්ලාස්ටික් / MDF / Melamine) | ☐ |
| 4.18. | වාහන අමතර කොටස්, වාහන අළුත්වැඩියාව, නඩත්තුකිරීම හා සේවා කිරීම | ☐ |
| 4.19. | නිෂ්පාදනාගාර යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | ☐ |
| 4.20. | නිෂ්පාදනාගාර උපකරණ අළුත්වැඩියාව සහ අමතර කොටස් | ☐ |
| 4.21. | පිරිද්දුම්/වෑද්දුම් හා ලියවන පට්ටල් වැඩ යකඩ/සුදු යකඩ (GAS,TIG,MIG,SPOT,Electric Welding) | ☐ |
| 4.22. | රසායන ද්‍රව්‍ය | ☐ |
| 4.23. | රසායනාගාර උපකරණ | ☐ |
| 4.24. | ප්ලාස්ටික් බෝතල්, ප්ලාස්ටික් බෝතල් මූඩි | ☐ |
| 4.25. | මුද්‍රණ කටයුතු (ලේබල්, ස්ටිකර්, ඇසුරුම් පෙට්ටි, බැනර්, යනාදිය) | ☐ |
| 4.26. | ආරක්ෂිත උපකරණ (ග්ලවුස් / මුඛවැසුම් /බූට් / හෙල්මට් යනාදිය) | ☐ |
| 4.27. | සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ / පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා උපකරණ | ☐ |
| 4.28. | කෘෂි උපකරණ | ☐ |
| 4.29. | තේ කොළ / කිරිපිටි | ☐ |
| 4.30. | නිළ ඇඳුම් සැපයීම (රෙදි සැපයීම සහ මැසීම) | ☐ |
| 4.31. | හානිකර කෘමීන් පාලනය කිරීමේ සේවාවන් | ☐ |
| 4.32. | සනීපාරක්ෂක කටයුතු කිරීම පිළිබඳව සේවා සැපයීම | ☐ |
| 4.33. | ආරක්ෂක සේවා සැපයීම., | ☐ |
| 4.34. | ලේබල් නිර්මාණය කිරීම සඳහා ආයතන | ☐ |
| 4.35. | කෙටි ආහාර සැපයීම උදෑසන සහ රාත්‍රී ආහාර සැපයීම) | ☐ |

**කොන්දේසි:-**

01. නියමිත අවස්ථාවල දී මිල ගණන් ඉදිරිපත් නොකරන හෝ නියමිත වේලාවට භාණ්ඩ, සේවා හා වැඩ සැපයීම් සිදු නොකරන හෝ මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී කොන්දේසි පිළිනොගන්නා සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය පූර්ව දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

02. භාණ්ඩ, සේවා හා වැඩ සඳහා අත්තිකාරම් මුදල් නොගෙවන අතර ගෙවීම් කරනු ලබන්නේ භාණ්ඩ හෝ සේවාවන් සැපයීමෙන් පසුවය. ඒ සඳහා දින 30ක ණය කාල සීමාවක් ලබා දිය යුතුය.

03. භාණ්ඩ, සේවා හා වැඩ සැපයීම සඳහා ආයතන හා පුද්ගලයන් විසින් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලබන පූර්ව ව්‍යාපාරික පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

04. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් ඇණවුම් කරනු ලබන භාණ්ඩ සැපයුම්කරු විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ගෙනවිත් භාරදිය යුතු අතර, ඒ සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ප්‍රවාහන පහසුකම් සැලසීමක් හෝ ප්‍රවාහන ගාස්තු ගෙවීම් කිරීමක් කරනු නොලැබේ.

05. අදාළ ඉල්ලුම්කරුට දුරකථන හා වෙනත් විද්‍යුත් සන්නිවේදන පහසුකම් තිබිය යුතුය.

06. භාණ්ඩ, සේවා හා වැඩ කාර්යක්ෂමව සැපයීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයවිසින් අනුමත කර ඇති ප්‍රසම්පාදන නීතිරීතිවලට හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් බල පවත්වන නියමයන්ට හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන බවට අයදුම්කරු එකඟ වේ.

..........................................................

දිනය.

..........................................................

ඉල්ලුම්කරුගේ අත්සන හා ව්‍යාපාරයේ නිල මුද්‍රාව.

## 05. පහත සඳහන් ලේඛණවල පිටපත් අමුණා එවිය යුතුය.

5.1 ව්‍යාපාරය / ආයතනය ලියාපදිංචි සහතිකයේ පිටපත් / වැට් බදු සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපත්

5.2 සමාගම් පැතිකඩ (Company Profile)

5.3 ඔබ ද්‍රව්‍ය හෝ සේවාසපයන ආයතනය පිළිබඳ විස්තර

5.4 තනිපුද්ගල ව්‍යාපාරයක්නම් එම ව්‍යාපාරය හිමිකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත්